2021

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
மனாானா ததததளா பபளரரரரர
Annual Performance Report



ජාතික කෞතකාගාර දෙපාර්තමෙන්තව
கபபபடள ாலகளெ ானளமள
Department of National Museum



බුද්ධශාසන සංස්කෘතික සහ ආගමික කටයුත අමාත්‍යාංශය
ளளமகததகமணதா ாதள மமமமளமம மம
Ministry of Buddhasasana,Cultural and Religious affairs

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය - 208

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ 07

(01). ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය:

1.1. හැඳින්වීම:

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වූ කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොට ම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වූ කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, හම්බන්තොට මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය හා පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම කෞතුකාගාර ප්‍රදර්ශන සහ දේශන හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර:

(අ). ආයතනයේ දැක්ම:

දැනුම සහ ආස්වාදයෙන් පරිපූර්ණ අර්ථවත් කෞතුකාගාර සේවාවක් මහජනතාව වෙත ලබා දීම.

(ආ). ආයතනයේ මෙහෙවර:

සංස්කෘතික සහ ස්වභාවික උරුමය පිළිබිඹු කෙරෙන කෞතුක භාණ්ඩ සහ නිදර්ශක අත්පත් කරගැනීම, එක්රැස් කිරීම, විධිමත්ව ලේඛණගත කිරීම, විද්‍යාත්මකව සංරක්ෂණය කිරීම සහ එම එකතූන් සහ දැනුම පර්යේෂණ, අධ්‍යයන, අධ්‍යාපන අරමුණු සහ රසාස්වාදය උදෙසා ඵලදායී ලෙසත් ආකර්ශනීය ලෙසත් මහජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම.

1.3. කාර්යභාරය

- පුරාවිද්‍යාව, මානව වංශ විද්‍යාව, මානව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව සහ භූ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කෞතුක භාණ්ඩ සහ නිදර්ශක රැස් කිරීම,ලේඛනගත කිරීම සහ ආරක්ෂා කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කොළඹ ජාතික කෞතුකාගාරය ඇතුළු කෞතුකාගාර එකොළහක ස්ථිර ප්‍රදර්ශන යාවත්කාලීනව පවත්වා ගැනීම, ආරක්ෂාව තහවුරු කිරීම සහ දෛනික නඩත්තු සහ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම.
- සංරක්ෂිත පැරණිතම ග්‍රන්ථ සහ පුස්කොළපොත් එකතුවක් සහිත ජාතික කෞතුකාගාර පුස්තකාලය මගින් පර්යේෂකයන් සඳහා ඵලදායී විමර්ශන සේවාවක් ලබාදීම.
- උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රකාශයට පත්කිරීම.
- ස්පෝලියා සෙලනිකා නැමති පර්යේෂණ සංග්‍රහය, කෞතුකාගාර එකතූන්ට අදාළ පර්යේෂණ සහ නාමාවලි, දෙපාර්තමේන්තු ප්‍රකාශන ලෙස මුද්‍රණය වී තිබෙන විරල ග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීම.
- උක්ත විෂය ක්ෂෙත්‍රයන්ට අදාළව දැනුම වර්ධනය කිරීම සඳහා දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සහිත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන වල විද්‍යාර්ථීන් සඳහා කෞතුකාගාර විද්‍යාව පිළිබඳ දැනුම ලබාදීම සඳහා සම්පත් දායක ආයතනය ලෙස කටයුතු කිරීම.
- නීතිමය කටයුතු සඳහා සත්ත්ව ආදර්ශක හඳුනාගැනීමට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම.
- බාහිර ආයතන විසින් කෞතුකාගාර ස්ථාපනය කිරීමේදී උපදේශන සේවා ලබාදීම.
- ආකර්ෂණීය කෞතුකාගාර සේවාවක් ලබාදීම තුළින් දෙස් විදෙස් කෞතුකාගාර නරඹන්නන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීම සහ එමඟින් ජාතික ආදායමට දායකත්වයක් ලබාදීම.

1.4. සංවිධාන සටහන: (ඇමුණුම: 01 බලන්න)

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර:

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර පිළිබඳ තොරතුරු පහත පරිදි දැක්විය හැකිය.

(අ). දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

- මානවවංශ විද්‍යා අංශය
- මානව විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- ජාතික කෞතුකාගාර පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය
- සංරක්ෂණ අංශය
- පාලන අංශය

- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ජායාරූප අංශය
- ප්‍රදර්ශන සැලසුම් අංශය
- තොරතුරු තාක්ෂණ අංශය

(ආ). දෙපාර්තමේන්තුවේ යටතේ පාලනය වන කෞතුකාගාර:

- කොළඹ ජාතික කෞතුකාගාරය
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය - කොළඹ
- මහනුවර ජාතික කෞතුකාගාරය
- රත්නපුර ජාතික කෞතුකාගාරය
- ගාල්ල ජාතික කෞතුකාගාරය
- ඕලන්ද කෞතුකාගාරය - පිටකොටුව
- ජන කෞතුකාගාරය - අනුරාධපුරය
- සමුද්‍ර කෞතුකාගාරය - ගාල්ල
- නිදහස් අනුස්මරණ කෞතුකාගාරය - කොළඹ
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය - හම්බන්තොට
- පුරාණ තාක්ෂණ කෞතුකාගාරය - පොළොන්නරුව

(02). ප්‍රගතිය හා ඉදිරි දැක්ම:

ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක:

(අ). ජයග්‍රහණ:

- රත්නපුර ජාතික කෞතුකාගාරයේ 6 සහ 7 මැදිරි නවීකරණය කිරීම.
- ජාතික කෞතුකාගාර පුස්තකාල ගිනි ආරක්ෂණ පද්ධතියේ පළමුවන අදියර නිම කිරීම.
- කොළඹ ජාතික කෞතුකාගාර පරිශ්‍රය තුල කාබනික ප්‍රතිචක්‍රීකරණ ඒකකයක් ස්ථාපිත කිරීම.
- කොළඹ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු පරිශ්‍රයේ උද්‍යාන නවීකරණ ව්‍යාපෘතියේ පළමුවන අදියර නිම කිරීම.
- දුර්ලභ කෞතුකාගාර ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ප්‍රකාශන මුද්‍රණයට භාරදීම.
    - (01.) මධ්‍යකාලීන සිංහල කලා - ආනන්ද කුමාරස්වාමි
    - (02.) ශ්‍රී ලංකාවේ මිල මුදල් - ලීලානන්ද කල්දේරා
    - (03.) ශ්‍රී ලංකාවේ ලෝකඩ මූර්ති කලා උරුමය
    - (04.) The Heritage of Sri Lankan Bronze Culture
- රත්නපුර ජාතික කෞතුකාගාරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- මහනුවර ජාතික කෞතුකාගාරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- ගාල්ල ජාතික කෞතුකාගාරයේ මැදිරි නවීකරණය හා සංරක්ෂණ කටයුතු වල පළමුවන අදියර නිම කිරීම.

(ආ). අභියෝග හා ඉදිරි ඉලක්ක:

- ශ්‍රී ලංකා ජාතික යුනෙස්කෝ කොමිසමේ සහයෝගය ඇතුව පහත දැක්වෙන දුර්ලභ කෞතුකාගාර ප්‍රකාශන හතර නැවත මුද්‍රණය කිරීම.

    1) Sigiri Graffiti (Vol - II)
    2) Gazetteer of the Central Province of Ceylon (Vol - I)
    3) Gazetteer of the Central Province of Ceylon (Vol - II)
    4) Geology of Ceylon

- දුර්ලභ කෞතුකාගාර ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීම.
    1) ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ කලා හා ශිල්ප - ආනන්ද කුමාරස්වාමි
    2) කෞතුක වස්තු සංරක්ෂණ මූලධර්ම - සිරිනිමල් ලක්දුසිංහ

- Spolia Zeylanica (Vol.-51) පර්යේෂණ ග්‍රන්ථය මුද්‍රණය කිරීම.
- කෞතුකාගාරය 20 වන කලාපය මුද්‍රණය කිරීම.
- A Guide to National Museum Colombo ග්‍රන්ථය මුද්‍රණය කිරීම.
- ඕලන්ද කෞතුකාගාරයේ මැදිරි නවීකරණ කටයුතු සිදුකිරීම.

- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ වහලය අළුත්වැඩියා කිරීම.
- ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ගිනි ආරක්ෂණ පද්ධතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම.
- උද්භිද විද්‍යා අංශයේ ශාකාගාරය සකස් කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය සකස් කිරීම.
- අනුරාධපුර ජන කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියා සිදුකිරීම.
- කොළඹ ජාතික කෞතුකාගාරයේ සිතුවම් මැදිරියේ වහලය අළුත්වැඩියා කිරීම .
- මහනුවර ජාතික කෞතුකාගාරයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- කාසි හා මුදල් නෝට්ටු පිළිබඳ ජංගම ප්‍රදර්ශනයක් සකස් කිරීම.

.....

සනූජා කස්තූරිආරච්චි

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්

සනූජා කස්තූරිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

		සටහන	කණ්ඩායම 2021 රු.	නැවත ඉදිරිපත් කළ 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-		
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		356,631,000	250,660,000	එසිඒ-3
-	තැන්පතු		9,866,581	5,057,080	එසිඒ-4
[illegible]	අත්තිකාරම් ගිණුම්		11,575,427	11,165,177	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
[illegible]	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**378,073,008**	266,882,257	
[illegible]	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**378,073,008**	266,882,257	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-		
[illegible]	ඉද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		378,073,008	266,882,257	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
[illegible]	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	173,300,780	177,317,781	
[illegible]	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	46,975,693	46,398,990	එසිඒ-2(ii)
[illegible]	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,341,835	1,542,400	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9			
[illegible]	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**221,618,308**	225,259,172	
	මූලධන වියදම්				
[illegible]	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	56,304,017	33,047,727	
[illegible]	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	78,328,980	13,771,440	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
[illegible]	හැකියා වර්ධනය	14	394,700	-	
[illegible]	වෙනත් මූලධන වියදම්	15	18,793,402	20,318,758	
[illegible]	මුළු මූලධන වියදම් (උ)		**153,821,099**	67,137,925	
	තැන්පතු ගෙවීම්		5,922,816	4,686,164	එසිඒ-4
[illegible]	අත්තිකාරම් ගෙවීම්		16,556,766	1,718,262	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-		
[illegible]	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		22,479,582	6,404,426	
[illegible]	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		397,918,989	298,801,523	
[illegible]	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ =(ඉ-එ)		(19,845,981)	(31,919,266)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(19,845,981)	(32,551,714)	එසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	632,448	එසිඒ-3
			(19,845,981)	(31,919,266)	

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	10,904,428,828	10,880,336,787
මූල්‍ය වත්කම්			
තෝරාකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	41,814,456	36,833,118
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**10,946,243,284**	**10,917,169,905**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		24,916,802	23,247,181
දේපළ පිරියත හා උපකරණ සංචිතය		10,904,428,828	10,880,336,787
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	
වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	16,897,654	12,953,489
අවසන් ශේෂය	ඒසිඒ-3	-	632,448
මුළු වගකීම්		**10,946,243,284**	**10,917,169,905**

පිටු අංක 01 සිට 63 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 64 සිට 78 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් ඔබින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2022.02.23	දිනය : 2022.02.22	දිනය : 2022.02.22

සනුජා සස්තුරිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික කොපුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

එන්.එච්.ඩබ්.එන්. ද අල්විස්
ප්‍රධාන ගණකාධිකාරි
ජාතික කොපුකාගාර දෙපාර්තමේන්තුව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 රු.	තක්ෂ නැවත ඉලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
භාණ්ඩ, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	15,339,316	35,226,740
දළුම් ලැබීම්	356,631,000	250,660,000
අත්තිකාරම් අයකර ගැනීම්	12,271,625	11,417,300
තැන්පතු ලැබීම්	9,866,581	5,057,080
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	394,108,522	302,361,120
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	220,234,913	223,586,831
සහනාධාර සහ මාරුකිරීම්	1,341,835	1,542,400
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,925,054	3,057,090
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	632,448
අත්තිකාරම් ගෙවීම්	17,243,890	1,718,262
තැන්පතු ගෙවීම්	5,922,816	4,686,164
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	247,668,509	235,223,196
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	146,440,013	67,137,924
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	146,440,013	67,137,924
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	146,440,013	67,137,924
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(146,440,013)	(67,137,924)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඓ)=(එ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඓ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන් :

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.03.99.00 20.02.01.01	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම් හෝ කුලී	77,000,000 4,140,000	10,000,000 4,140,000	5,186,734/47 1,460,164/31	52% 35%
20.02.02.99	ණය පොලිය	1, 800, 000	1 800,000	1,388,318/94	77%

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	252,500,000	252,500,000	221, 618, 308	88%
ප්‍රාග්ධන	229,500,000	229,500,000	153, 821, 099	67%

3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කොළඹ	කාබනික පොහොර අංගනය ඉදිකිරීම.	3,385,000	3,385,000	2, 863,665/45	85%
02	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පොළොන්නරුව	ඉදිකිරීම් කටයුතු	5,000,000	5,000,000	4,517,419/72	90%
03	දුම්රිය දෙපාර්තමේන්තුව	නිවාඩු දින ගමන්	_	41, 560	41, 560	100%

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		800,000,000		
9152	යන්ත්‍රෝපකරණ		102, 059,486/73		
9153	ඉඩම්		10,002,369,340/86		
9154	අස්පෘශ්‍ය වත්කම්		–		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		–		
9160	කෙරෙමින් පවතින වැඩ		–		
9180	බදු දෙන ලද වත්කම්		–		

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලොකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAA/B/NM/77/2021/FA

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 අප්‍රේල් 20 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත සම්පිණ්ඩන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එච්.එම්.රණසිංහ මුණ්ඩා

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

පිටපත්:- 1. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන එවා ඇත.

2. ප්‍රධාන ගණන් දීමේ නිලධාරී, බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAA/B/NM/77/2021/FA

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 අප්‍රේල් 28 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2. **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4. **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

1.2. **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4. **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6. **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1. **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

1.6.1.1. **මූල්‍ය නොවන වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ ජාතික කෞතුකාගාරය පිහිටුවා ඇති හෙක්ටයාර් 4.6317 ක ඉඩම 2022 මාර්තු මස 29 දින වන විටත් කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ එම ඉඩම හා ගොඩනැගිල්ල 2013 වර්ෂයේ සිදු කළ තක්සේරු වාර්තාවක් පදනම් කරගෙන පිළිවෙලින් රු.10,002,369,340 ක් සහ රු.800,000,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති අනුරාධපුර සහ ගාල්ල ජාතික කෞතුකාගාර පිහිටුවා තිබූ ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට රාජ්‍ය ආයතන සමඟ ලිපි හුවමාරු කර තිබුණද, 2022 මාර්තු මස වන විටත්, එම ඉඩම් පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර වන ඕලන්ද යුග කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය හා මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය සම්බන්ධයෙන් දේපළ පවරා ගැනීම් කටයුතු විගණිත දින වන විට අවසන් කර තිබූ නමුත්, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර එම වත්කම්වල පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ කෞතුකාගාර තුළ ප්‍රදර්ශනය සඳහා පවතින කෞතුක භාණ්ඩ පිළිබඳව භෞතික සමීක්ෂණයක් සිදුකර එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම භාණ්ඩ 2018 වර්ෂයෙන් පසුව නැවත 2021 වර්ෂයේදී අංශ 06 ක පමණක් සමීක්ෂණය කර තිබුණි. එම සමීක්ෂණ මණ්ඩල අවසන් වාර්තාවක්ද 2022 මාර්තු මස දක්වා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2021 මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ (ඒසීඒ - 2 (i)) අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වර්ෂය තුළදී එකතුව රු.78,328,980 ක මුදලක් වැය කර තිබුණි. නමුත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැණුම් එකතුව රු.27,181,790 ක් ලෙස සටහන් කිරීම නිසා වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමට දරන ලද එකතුව රු.51,147,190 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අඩුවෙන් සටහන් කර තිබුණි.

(ඊ) 2020 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6) එකතු වටිනාකම රු.77,967,446 ක් විය. 2021 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ එම ආරම්භක ශේෂය රු.91,659,556 ක් ලෙස සටහන් කිරීම නිසා 2021 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ - 6) ආරම්භක ශේෂය රු.13,692,110 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

1.6.1.2. **තැන්පතු ගිණුම් ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේ සිට 2019 දක්වා වූ කාලය තුළ තැන්පතු ගිණුම්වල තැන්පත් කළ එකතු වටිනාකම රු.5,213,776 ක වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු නිරවුල් කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට පියවරගෙන නොතිබුණි.

1.6.2. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(i) ඇප ලේඛනය	මූ.රෙ.891 (1)	ඇප තැබිය යුතු සියළු සේවකයින් ඇප තබා ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.
(ii) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය	මූ.රෙ.454 (2)	පවත්වා නොතිබුණි.
(iii) ණයගැති හා ණයහිමි ලේඛනය	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය	ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. අග්‍රිම කළමනාකරණය

2021 වර්ෂයේ භාණ්ඩාගාර අවසන් අග්‍රිම සාරාංශ වාර්තාව (SA – 70) අනුව අග්‍රිම ලැබීම් එකතුව රු.375,440,570 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ වූ අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව (ඒසීඒ - 3) සහ අග්‍රිම ලැබීම් ලිපි ලේඛන අනුව අග්‍රිම ලැබීම් එකතුව රු.368,469,291 ක් වීම නිසා භාණ්ඩාගාර වාර්තා සමඟ සැසඳීමේදී රු.6,971,279 ක අග්‍රිම ලැබීම් වෙනසක් නිරීක්ෂණය විය.

2.2. ආදායම් කළමනාකරණය

පිටකොටුව ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියාවට අදාළ ගිවිසුම ප්‍රකාරව එම කාර්යය 2019 අගෝස්තු 01 දින ආරම්භ කර 2020 මැයි 01 දින අවසන් කළ යුතුව තිබුණි. 2021 නොවැම්බර් 30 දින වන විට කාලය දීර්ඝ කිරීම් අවස්ථා 02 කදී ලබාදී තිබූ අතර, 2022 මාර්තු මස වන විටත් එම කාර්යයන් අවසන් කර නොතිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්තුව නියමිත පරිදි ඉටු නොකිරීම හේතුවෙන් දෛනිකව සියයට 0.05 ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව (Delay charges) අයකර ගත යුතු වුවත්, එම ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3. සීමා ඉක්මවීම්

කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ ර.නි.අ. "බී" ගිණුමේ ලැබීම්වල අවම සීමාව රු.10,800,000 ක් වූ අතර, එම සීමාව රු.9,000,000 දක්වා සංශෝධනය කිරීමට අනුමැතිය ඉල්ලා තිබුණද, 2022 මාර්තු මස දක්වා එම අනුමැතිය ලැබී නොතිබුණි. ඒ අනුව අනුමත අවම ලැබීම් සීමාව රු.10,800,000 ක් වූ අතර, වර්ෂය තුළ මුළු ලැබීම් රු.9,162,499 ක් වීම නිසා එකතුව රු.1,637,501 කින් අවම ලැබීම් සීමාවට ලහාවී නොතිබුණි.

2.4. බැරකම් හා බැඳීම් වලට එළඹීම

2021 වර්ෂයේ බැඳීම් හා බැරකම් වලට එළඹීම පිළිබඳව පරීක්ෂා කිරීමේදී 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වැය විෂයයන් 10 කට අදාළව ප්‍රතිපාදන ඉතිරි කිරීම් ඉක්මවා එකතුව රු.2,978,623 ක බැරකම් වලට එළඹී තිබුණි.

2.5. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	දෙපාර්තමේන්තුව සතු මෝටර් රථවාහන 05 ක ඉන්ධන දහනය පිළිබඳව 2019 වර්ෂයෙන් පසුව පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(I) මුදල් රෙගුලාසි 268 (අ) සහ 1646	මෙම මුදල් රෙගුලාසි ප්‍රකාරව මාසික සාරාංශ වාර්තා සමඟ ධාවන සටහන් විස්තර නියමිත දිනවලදී ඉදිරිපත් කර නොතිබුණි.
	(II) මුදල් රෙගුලාසි 1645 (අ)	දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා ලොග් සටහන් පොත් පවත්වාගෙන යනු ලැබුවද, ඒවායේ යාවත්කාලීනව තොරතුරු සටහන් කර නොතිබුණි.
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 01 හි (ආ) වන වගන්තිය	2021 දෙසැම්බර් 31 දිනට මියගිය සේවකයින් 03 දෙනෙකුට අදාළව එකතුව රු.229,420 ක මුදලක් නිරවුල් කරගෙන නොතිබුණි.

2.6. අවධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් 2011 අගෝස්තු 10 දින සිට 2021 ජූලි 31 දින දක්වා වර්ෂ 10 ක කාලසීමාවකට බදු පදනම මත ගොඩනැගිල්ලක් හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ලබාදී තිබුණි. එහි නවීකරණ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ එකඟතාවයකින් තොරව 2013 වර්ෂයේදී එම බදු කාලසීමාව වර්ෂ 35 ක් දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීමටද හස්ත කර්මාන්ත මණ්ඩලය කටයුතු කර තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් වූ වරිපනම් ගාස්තු, ජල ගාස්තු වැනි වියදම් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබූ අතර, 2021 ජූලි 31 දිනට දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු හිඟ බදු කුළී එකතු වටිනාකම රු.91,921,106.60 ක් විය. තවද, 2021 අගෝස්තු මස සිට ගෙවිය යුතු මාසික කුළී මුදල නව බදු ගිවිසුම් ප්‍රකාරව සිදු කළ යුතු වුවත්, දෙපාර්ශවයේම එකඟතාවයකින් යුතුව අත්සන් කළ යුතු නව බදු ගිවිසුමකට එළඹීමට සහ ඒ අනුව බදු කුළී ගෙවීමකින් තොරව අනවසරයෙන් හස්ත කර්මාන්ත මණ්ඩලය මෙම ගොඩනැගිල්ල භාවිතා කරමින් තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හම්බන්තොට කෞතුකාගාරයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.22,509,349 ක ව්‍යාපෘතියකට 2015 නොවැම්බර් 30 දින ගිවිසුමකට එළඹී තිබුණි. 2016 අප්‍රේල් 30 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 18.09 ගෙවීම් කර තිබූ අතර, පවතින අඩුපාඩු සකසා දීමේ එකඟතාවය මත මෙම ගොඩනැගිල්ල භාරගෙන තිබුණද, එම අඩුපාඩු 2021 දෙසැම්බර් 31 දක්වා සම්පූර්ණ කරගෙන නොතිබුණි.

(ආ) පිටකොටුව ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණය සහ අළුත්වැඩියා කිරීම් සඳහා එකතුව රු.97,259,127 ක පිරිවැය ඇස්තමේන්තුවකට 2019 වර්ෂයේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. 2020 මැයි 01 දින වැඩ නිම කිරීමට නියමිතව තිබූ මෙම කාර්යය සඳහා වන කාලය, 2021 නොවැම්බර් 30 දින දක්වා අවස්ථා දෙකකදී කාලය දීර්ඝ කරගෙන තිබුණි. මෙම කාර්යය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.62,863,055 ක් ගෙවීම් කර තිබූ අතර, එදිනට භෞතික ප්‍රගතිය සියයට 51 ක් විය. අනුමත ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීමකින්ද තොරව මාස 03 ක පමණ කාලයක් ගතවී ඇති මෙම ව්‍යාපෘතියේ කටයුතු 2022 මාර්තු මස වන විටත් නිමකර නොතිබුණි.

(ඇ) 2021 අගෝස්තු 04 දින රු.මිලියන 98.55 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත වැඩ ආරම්භ කරන ලද ජාතික කෞතුකාගාරයේ පුස්තකාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 ජනවාරි 31 දින වැඩ අවසන් කළ යුතුව තිබුණි. 2022 මාර්තු මස වන විට කාර්යය අවසන් කිරීමේ කාලය අවසන් වී මාස 02 ක් ගතවී තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.23,429,655 ක් ගෙවීම් කර තිබූ එම ව්‍යාපෘතියේ භෞතික කාර්යය සාධනය සියයට 35 ක් විය.

(ඈ) 2021 අගෝස්තු 16 දින රු.මිලියන 11.6 ක ඇස්තමේන්තුවක් මත වැඩ ආරම්භ කරන ලද ජාතික කෞතුකාගාරයේ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශන මැදිරිය සැකසීමේ ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,919,333 ක් ගෙවීම් කර තිබුණි. භෞතික ප්‍රගතිය සියයට 45 ක් පමණ වූ මෙම ව්‍යාපෘතියේ කටයුතු 2022 මාර්තු මස වන විට කොන්ත්‍රාත්කරු විසින් අතරමඟ නතර කර දමා තිබුණි.

3.2. ප්‍රසම්පාදනයන්

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය ප්‍රකාරව වැටි බඳු සඳහා මුදල් ගෙවීමෙන් පසුව ඊළඟ මස 15 දින හෝ ඊට පෙර එකී වැටි බදු ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම්දිය යුතු වුවත්, පිටකොටුව ඕලන්ද කෞතුකාගාරය අළුත්වැඩියාවට අදාළව ගෙවීම් කිරීමේදී වැටි බදු ගෙවීම් විස්තර දැනුම්දී නොතිබුණි.

3.3. පාඩු හා හානි

අත්තනගල්ලෙන් සොයාගත් පැරණි පාරුව 1998 වර්ෂයේ සිට ජාතික කෞතුකාගාර උද්‍යානයේ නැගෙනහිර අන්තයෙහි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සකස් කළ ටැංකියක ජලයෙහි බහා තිබූ අතර, පසුව සංරක්ෂණමය කාර්යයන් සඳහා එම පාරුව 2021 වර්ෂයේදී පැරණි කරත්ත තැන්පත් කර තිබූ මැදිරිය වෙත ගෙන ගොස් තිබුණි. මෙම පාරුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කිරීම සඳහා දීර්ඝ කාලයක සිට විවිධ පියවර ගනු ලැබුවද, එම සංරක්ෂණ කටයුතු නිසි පරිදි ඉටු නොකිරීම නිසා කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනයට තිබූ ඉතා වටිනා පුරාවස්තුවක් දිරාපත් වී සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි.

3.4. කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිටකොටුව ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියාවන් රු.මිලියන 97.26 ක ඇස්තමේන්තු වටිනාකමින් රු.මිලියන 62.8 ක් පමණ වැයකර නිම කරමින් පැවතුණි. පිටකොටුව කුමාර විදියේ පිහිටා තිබෙන වසර 350 ක් පමණ පැරණි මෙම කෞතුකාගාරය ඉදිරිපිට වාහන නවතා තැබීමට පහසුකම් නොමැති වීම, එය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට විශාල බාධාවක් වී තිබූ අතර, 2019 වර්ෂය දක්වා තිබූ එම කෞතුකාගාරය ඉදිරිපිට වූ රථගාල් කිරීමේ පහසුකම් යළි ලබා ගැනීමට කළමනාකරණයට නොහැකි වී තිබුණි.

(ආ) කොළඹ ජාතික කෞතුකාගාරයේ උද්‍යාන නවීකරණ ව්‍යාපෘතියේ අදියර I සහ IV සඳහා ප්‍රථමයෙන් පිළියෙල කර තිබූ මුළු පිරිවැය වටිනාකම රු.45,664,195 ක් වූ අතර, සංශෝධිත මුළු පිරිවැය වටිනාකම රු.50,055,355 ක් විය. නමුත් කොන්ත්‍රාත්තුව පිරිනැමූ වටිනාකම රු.43,337,970 ක් විය. ඒ අනුව සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව සහ ඉටු කරන ලද කොන්ත්‍රාත් කාර්යය අතර, විචලනය සියයට 18.37 ක් එනම්, රු.9,930,968 ක් වූ අතර, ඒ අනුව සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම ලෙස රු.53,268,938 ක් කාර්යය අවසානයේදී මිණුම් කර ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. මෙම කාර්යය ආරම්භයේදී ශක්‍යතා අධ්‍යයනයක් කර ප්‍රසම්පාදන කාර්යය නිවැරදිව හඳුනා නොගැනීම සහ ප්‍රමාණ වැරදීම් (Quantity error) හේතුවෙන් එකතුව රු.9,930,968 ක විචලන මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ ර.නි.අ. "බී" ගිණුමට අදාළ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සේවකයින්ගෙන් අයවිය යුතු මුළු ණය මුදල රු.934,277 ක් විය. 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සමඟ නිකුත් කළ මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) සහ (ඊ) අනුව ක්‍රියා කර එම ණය නිරවුල් කිරීමට ක්‍රියා කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 566 ක් වුවත්, තත්‍ය කාර්ය මණ්ඩලය 335 ක් වීම නිසා එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 231 ක් විය. මෙම පුරප්පාඩු වලින් විධායක මට්ටමේ තනතුරු 16 න් තනතුරු 08 ක් සහ තෘතියික මට්ටමේ තනතුරු 05 න් 04 ක් පුරප්පාඩු වී පැවති අතර, මෙම සේවක ඌනතාවය සමාලෝචිත වර්ෂය තුළදීද සම්පූර්ණ කර ගැනීමට අනුමැතිය ඉල්ලා ඇතත් නොලැබීම නිසා නොහැකි වී තිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත ද්විතීයික මට්ටමේ කාර්ය මණ්ඩලය 242 ක් වුවත්, එම මට්ටමේ තත්‍ය කාර්ය මණ්ඩලය 96 ක් වීම නිසා එම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඛ්‍යාව 146 ක් විය. එම පුරප්පාඩු තුළ ඇතුළත් MN – 4 ශ්‍රේණියේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර දෙපාර්තමේන්තුගත තනතුරක් වූ අතර, වසර ගණනාවක සිට පුරප්පාඩුවී පැවති, ඉතා වගකීම් සහගත කාර්යභාරයක් ඉටු කළ යුතු මෙම තනතුර සම්පූර්ණ කර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලිඛිත අවසර ඉල්ලා සිටියද, අවසර නොලැබීම නිසා එම තනතුර තවදුරටත් පුරප්පාඩු වී පැවතුණි.

එච්.එම්.රණසිංහ බුණ්ඩා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

(04). කාර්ය සාධන දර්ශක:

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව):

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% -74%
සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් කළමනාකරණය	95.0		
සංස්කෘතික විවිධත්වය හා තිරසර සංවර්ධනය	84.9		
පර්යේෂණ හා සංවර්ධනය		74.4	

(05). තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය:

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග:

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%-49%	50%-74%	75% - 100%
16. සෑම මට්ටමකම අදාළ ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතනයක් ගොඩනැගීම. (SGD 16)	16.1 අද්විතීය භාණ්ඩ වකතුවක් සඳහා කෞතුක භාණ්ඩ නිදර්ශක වකතූන් ශක්තිමත් කිරීම.	**මානව විද්‍යා අංශය** ❖ මානව විද්‍යා කෞතුක භාණ්ඩ වකතුවට අයත් භාණ්ඩ 17ක් සංරක්ෂණය කිරීම හා ජායාරූප ගැනීම. 01. තරාදිය 02. ලාස් 02 ක් 03. නැලිය 04. කුරුණිය 05. ගැලුම 06. නාගරාක්ෂ වෙස් මුහුණ 07. වෙස් මුහුණුක් 08. කාපිරි වෙස් මුහුණ 09. කෝලම් වෙස් මුහුණක් 10. දෙමළ කෝලම වෙස් මුහුණ 11. හාල් මනින උපකරණය 12. මුදලි කෝලම වෙස් මුහුණ 13. ආරච්චි කෝලම වෙස් මුහුණ 14. නීල කීර්ති රජුගේ වෙස් මුහුණක් 15. වෙස් මුහුණක කොටසක් 16. ග්‍රැමෆෝනයක කොටසක් **මානව වංශ විද්‍යා අංශය** ❖ අත්පත් කරගත් භාණ්ඩ ප්‍රමාණය • මැටි ගඩොලක් - 2021.1.1 • කුඩා හිටි බුද්ධ ප්‍රතිමාවක් -2021.02.01 • දිය සායම් චිත්‍රයක් - 2021.03.01 • දිය සායම් චිත්‍රයක් - 2021.04.01 • තේ කෝප්ප කට්ටලයක් **සත්ත්ව විද්‍යා අංශය** ❖ Holotype වකතුවට අදාළ නිදර්ශක සංරක්ෂණය කිරීම (HT 60-HT 100) ❖ Paratype වකතුවට අදාළ නිදර්ශක සංරක්ෂණය කිරීම T 30 -T 140			100 100 100 75

		❖ ක්ෂීරපායින් එකතුවලට අදාල නිදර්ශක 756 ක් සංරක්ෂණය කිරීම ❖ WHT එකතුවට අදාල උභය ජීවීන් සංරක්ෂණය කිරීම (AM 1700 – AM 2015) **<u>උද්භිද විද්‍යා අංශය</u>** ❖ 2021 වර්ෂයේ ජාතික කෞතුකාගාර උද්‍යානයේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ශාක ගහනවල නිදර්ශක එකතුව ❖ නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ලද ඖෂධීය ශාක වල හා විෂ සහිත ශාක වල නිදර්ශක එකතුව **<u>භූ විද්‍යා අංශය</u>** ❖ පුරාසික ෆොසිල එකතුවට අයත් ආදර්ශක 43ක හා මයෝසීන ෆොසිල එකතුවට අයත් ආදර්ශක 61ක සංරක්ෂණ කටයුතු සිදුකිරීම. ❖ පුරාසික හා මයෝසීන ෆොසිල එකතුවට අයත් තොරතුරු යාවත්කාලීන කිරීම. ❖ මැණික් එකතුවට අයත් ආදර්ශක 271ක තොරතුරු යාවත්කාලීන කිරීම. **<u>තොරතුරු තාක්ෂණ අංශය</u>** ❖ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට 2021 වසර තුළ පරිත්‍යාග කරන ලද කෞතුක භාණ්ඩ ලියාපදිංචි කිරීම, අංක නිකුත් කිරීම හා ප්‍රධාන ලියාපදිංචි ලේඛන යාවත්කාලීන කිරීම.			85 85 100 100 100 100 100 100
	16.2 අභ්‍යන්තර තත්ත්වයන්ට අනුව සංරක්ෂිත කෞතුක භාණ්ඩ/නිදර්ශක එකතූන් පවත්වාගෙන යාම.	**<u>මානව විද්‍යා අංශය</u>** ❖ මිනුම් උපකරණ එකතුව තත්ත්ව පරීක්ෂාවක් සිදු කිරීම, පිරිසිඳු කිරීම, සංරක්ෂණය කළ යුතු භාණ්ඩ සංරක්ෂණය සඳහා යොමු කිරීම. ❖ වෙස් මුහුණු එකතුව තත්ත්ව පරීක්ෂාවක් සිදු කිරීම, පිරිසිඳු කිරීම, සංරක්ෂණය කළ යුතු භාණ්ඩ සංරක්ෂණය සඳහා යොමු කිරීම. ❖ මානව විද්‍යා ගබඩාවේ එළිමහනේ තැන්පත් කර			100 100 100

		ඇති භාණ්ඩ වකතුව පිරිසිඳු කිරීම, තත්ත්ව පරීක්ෂාවක් සිදු කිරීම සහ සංරක්ෂණය කළ යුතු භාණ්ඩ සංරක්ෂණය සඳහා යොමු කිරීම.			
		<u>මානව වංශ විද්‍යා අංශය</u> ❖ සංරක්ෂණය සඳහා කාසි 312 ක් සහ තුවක්කු 10 ක් සංරක්ෂණ කිරීම සඳහා සංරක්ෂණ අංශයට භාරදීම.			100
		<u>සත්ත්ව විද්‍යා අංශය</u> ❖ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ සත්ත්ව ආදර්ශක සංරක්ෂණ හා දිලීර මර්දනය. ❖ WHT වකතුවට අදාළ කටුස්සන්ගේ සංරක්ෂණය කිරීම. (RLZ 01 – RLZ 60)		52	100
		<u>කීට විද්‍යා අංශය</u> ❖ **C**oleoptera ගෝත්‍රයේ පෙට්ටි 45 ක නිදර්ශක 11340 ක් කපුරු යොදා සංරක්ෂණය කිරීම. ❖ Hymenoptera ගෝත්‍රයේ පෙට්ටි 20 ක නිදර්ශක 2218 ක් කපුරු යොදා සංරක්ෂණය කිරීම. ❖ කීට විද්‍යා අංශය සතුව වියලි නිදර්ශක 129,177 ක් ද තෙත් නිදර්ශක 225 ක් ද ඇති බවට දෙවන කාර්තුවේදී සංගණනය කර අවසන් කරන ලදී.			100 100 100
		<u>උද්භිද විද්‍යා අංශය</u> ❖ ජාතික කෞතුකාගාර උද්‍යානයේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ලද නිදර්ශක 52ක වියළි සංරක්ෂිත ශාකාගාර පත්‍රිකා සකස් කිරීම. ❖ නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ලද නිදර්ශක 19ක වියළි සංරක්ෂිත ශාකාගාර පත්‍රිකා සකස් කිරීම සහ තෙත් නිදර්ශක 07ක් සකස් කිරීම.			100 100

